Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2016-06-27 |
|---|---|---|---|

පැමිණිලිකරු : දැඩිමුණි අචිනි කුමාරි මිය
නො 504/5, බෝගහවත්ත,
අම්බලන්ගොඩ.

වගඋත්තරකරුවන් : 01. සුමිත් පරාක්‍රමවංශ මයා
විදුහල්පති,
ධර්මාශෝක විද්‍යාලය,
අම්බලන්ගොඩ.

02. ලේකම්,
අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලය
ධර්මාශෝක විද්‍යාලය,
අම්බලන්ගොඩ.

<u>පැමිණිලි අංකය : **HRC/MT/49/16/N**</u>

ඉහත පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභා මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දියණිය වන සෙල්ලාහන්දි ශෙනුලි අමායා ද සිල්වා දැරිය අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ 2016 පළමු වසරට ඇතුලත් කිරීම සඳහා 'ළමයා සමග විදේශගතව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන්' යන ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ලකුණු 70ක් උපයාගත් බවයි. මේ සම්බන්ධව විරෝධතා පරීක්ෂණ සඳහා දුරකථන මගින් කළ දැනුම් දීම පරිදි 2016-01-09 වන දින ධර්මාශෝක විද්‍යාලයට ගිය බවත්, එහිදිද විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා විසින් ලකුණු වෙනස් නොවන බව තහවුරු කළ බව ප්‍රකාශ කළ බවද පැමිණිල්ලෙන් දක්වා ඇත.



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman | 011-2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2696470 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் | 011-2689558 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

එනමුත් එදිනම විරෝධතා පරීක්ෂණ මණ්ඩලය හා විරෝධතා ඉදිරිපත් කළ අයදුම්කරුවන්ගේ 04 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් පැමිණිලිකාරියගේ නිවසට පැමිණ ලබා ගත් ලකුණු 70න් 05ක් අහිමි කළ බවත් දරුවා පාසලට ඇතුලත් කර ගැනීමේ 2013/23 චක්‍රලේඛනයේ 10.6 ව්‍යවස්ථාවට අනුව විරෝධතාකරුවන් හා විරෝධතාවයට ලක්වූ අය වෙත වෙනම කැඳවිය යුතු මුත් විරෝධතාකරුවන්ද මණ්ඩලයේ සාමාජිකයන්ද නිවසට පැමිණීමෙන් තමන් බියට හා විමතියට පත් වූ බවත් ප්‍රකාශ කර ඇත.

තවද අම්බලන්ගොඩ බෝගහවත්ත කලාපයෙන්ම මෙසේ ආසන්න පාසලකට ලකුණු 05ක් කපා දමා ඇත්තේ තම දරුවාට පමණක්ම බවත් තම ලිපිනයට ඉතාම ආසන්න හා ලිපිනයට දුරින් මෙම පාසලට ඉල්ලුම්කල කැඳවීම් අංක PR 38, PR 281, PR 332, PR 20, PR 63, PRP 01, PR 184, PR 69, PR 247, PR 109, PR 04, PR 182 ,හා PR 62 යන කිසිඳු දරුවෙකුට ආසන්න පාසල ලෙස සලකා දේවානන්ද විදුහල සඳහා ලකුණු අහිමි කර නොමැති බවද සඳහන් කර ඇත. තවද තම ලිපිනයේ සිට අදාළ දේවානන්ද විද්‍යාලය වෙත ගමන් කිරීමේදී අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය බාධකයක් ලෙසට පවතින බවද සඳහන් කර ඇත.

මුල් සම්මුඛ පරීක්ෂණයේදී ලබා දුන් ලකුණු ප්‍රමාණය අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේදී වෙනසකට ලක් නොවූ හෙයින් එම අවස්ථාවෙන් පසුව මුලින් උපයාගත් ලකුණු අහිමි කිරීම චක්‍රලේඛනයට පටහැනි ක්‍රියාවක් බවත් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කොට සහනයක් සලසා දෙන ලෙසත් පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තරපාර්ශවයේ සැලකිරීම් :-**

උක්ත පැමිණිල්ල සම්බන්ධව මානව හිමිකම් කොමිසන් සභාව විසින් සිදුකර ඇති වාර්තා කැඳවීමට පිළිතුරු සපයමින් 2016-02-16 දිනැතිව විදුහල්පතිවරයා විසින් දන්වා ඇත්තේ "විදේශගත දෙමාපියන්ගේ දරුවන් යන ගණය" යටතේ උක්ත විද්‍යාලයට ඉල්ලුම්කල මෙම පෙත්සම්කාරියගේ දරුවාට

| | | |
|---|---|---|
| විදේශගතව සිටි කාලය සඳහා | - | ලකුණු 25 |
| විදේශගත වූ ස්වභාවය සඳහා | - | ලකුණු 10 |
| පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය | - | ලකුණු 35 |
| එකතුව | - | ලකුණු 70 ක් ලෙස ලකුණු ලබා දුන් |

බවයි.

තාවකාලික ලේඛනය ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ඉදිරිපත් වූ විරෝධතා පරීක්ෂයේදී GPS තාක්ෂණය අනුව නාවුක සැතපුම් ආශ්‍රයෙන් මැනුම් කල විට ධර්මාශෝක විද්‍යාලයට නාවුක සැතපුම් 0.29 ක්ද දේවානන්ද විද්‍යාලයට නාවුක සැතපුම් 0.22 ක්ද වූ නිසා ආසන්න පාසල වූ දේවානන්ද විද්‍යාලයට ලකුණු 05ක් අඩු කල බව දන්වා ඇත .

ඉන් අනතුරුව අදාල ගණය යටතේ 03 වන තැන සිටි අයදුම්කාරියගේ සහ මෙම පෙත්සම්කාරියගේ ලකුණු සමවීම නිසා වඩාත් පාසලට ආසන්න තුන්වන අයදුම්කාරිය පාසලට තෝරා ගත් බවත් පෙත්සම්කාරිය ලැයිස්තුවෙන් ඉවත් වූ බවත් සඳහන් කර ඇත.

**පැමිණිලි පාර්ශවයේ විරෝධතා දැක්වීම –:**

2016-03-07 දිනැතිව පෙත්සම්කාරිය සිය විරෝධතා දක්වමින් සඳහන් කර ඇත්තේ, විදුහල මගින් විරෝධතා පරීක්ෂණයේදී තමාගේ ලකුණු වෙනස් නොවන බවට සටහන් තබා ගන්නා ලද බවයි. එසේම පාසලට ඇති දුර විමර්ශනය කිරීමේදී ධර්මාශෝක විදුහල මගින් කිසිදු අයදුම්කරුවෙකු සඳහා GPS තාක්ෂණය භාවිතා නොකල බවත් තමා වෙනුවෙන් පමණක් එය චේතනාන්මකව භාවිතා කල බවත් සඳහන් කර ඇත. තවද මෙම පරීක්ෂණය අපක්ෂපාති හා සාමාන්‍ය නොවූ බවත් තමන් මානසික පීඩනයකට හා කම්පනයකට පත්කල පරීක්ෂණයක් ලෙස පැවැත්වූ බවත් සඳහන් කර ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය :-**

මෙම පැමිණිල්ලට අදාලව සිදුකරන ලද පරීක්ෂණයේදී පැමිණිලිකාරිය විසින් සිය මුල් පැමිණිල්ලෙන් දක්වන ලද කරුණු නැවත පැහැදිලි කර ඇත. තවද තමන් නීත්‍යානුකූල ලෙස උපයාගත් ලකුණු 70 අභියාචනා සහ විරෝධතා පරීක්ෂණයේදීද වෙනසකට ලක් නොවූ බවත් එදින සවස මෙම ගණය යටතේ පොරොත්තු ලේඛනයේ අංක 01 යටතේ රැඳී සිටි ලක්මාලි යන අය විරෝධතා පරීක්ෂණයේදී නාගරික මන්ත්‍රී දේව් රොහාන් සහ පසුව දන්නා පරිදි ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන්ද, ධීවරයන් දෙදෙනෙකුද ස්ථානීය පරීක්ෂණයට පැමිණ තමාට කිසිදු කරුණක් පැහැදිලි නොකර ධීවරයන් දෙදෙනා GPS තාක්ෂණයෙන් මැනුමක් කර දේවානන්ද විද්‍යායට යන බව කියා පිටත්ව ගිය බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම පරීක්ෂණය සඳහා තමන්ව සම්බන්ධ කර නොගත් බවත් ඔවුන් පිටවී ගොස් විනාඩි 10කට පසුව ගුරුමහත්මියක් දුරකථනයෙන් අමතා දේවානන්ද පාසලට වඩාත් ආසනන්න නිසා ලකුණු 05ක් කපාහල බව ප්‍රකාශ කල බැවින් තමන් එම මොහොතේම ධර්මාශෝක විද්‍යාලයට ගොස් අභියාචනා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කල ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ විදුහල්පතිතුමා මුණ ගැසී විමසූ බවත්, එවිට

මණ්ඩලයේ එක් නිලධාරියෙකු විරුද්ධ වූ හෙයින් නැවත මැනුමක් කල බවට පවසන ලද බවත් සඳහන් කර ඇත. ඒ අනුව මණ්ඩලය තමා කැඳවා තමා හට දැනුම් දුන් තීරණය වන "ලකුණු වෙනස් නොවන බව" පසුව වෙනසකට ලක්කර ඇති බවත් සඳහන් කර ඇත.

තමාගේ නිවසේ නාප්පයට යාබදව ඇති නිවසේ දරුවාගේ සිට මෙම අම්බලන්ගොඩ බෝගහවත්ත ලිපිනයේ දරුවන් 16 දෙනෙකුට දේවානන්ද විද්‍යාලයට ලකුණු අහිමි නොකර තමා ඉල්ලුම් කර ගණයෙන් මෙසේ ලකුණු අහිමි කිරීම කර ඇති බවත් ඉන් තම දරුවාට දැඩි අසාධාරණයක් වූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

වගඋත්තර පාර්ශවය වෙනුවෙන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය -- අභියාචනා පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් කේ.එස්.එන්.ජේ ද සිල්වා මහතා (නියෝජ්‍ය විදුහල්පති) වගඋත්තරකරුවන් වෙනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පෙත්සම්කාරියගේ දරුවා "විදේශගතවූ අයගේ දරුවන් යන ගණය" යටතේ තම විද්‍යාලයේ 1 වසරට ඇතුලත් කිරීම සඳහා ඉල්ලුම්කර ලකුණු 70ක් උපයාගෙන තාවකාලික ලේඛනයේ 02 වන ස්ථානයට නම සඳහන් වූ බවයි.

විරෝධතා පරීක්ෂණ අවස්ථාවේදී මෙම අයට එරෙහිව ලද විරෝධතාවය නිසා විරෝධතා පරීක්ෂණ අවස්ථාවේදී Google මගින් දුර මැනුම් කල බවත් විරෝධතාකරු එම අවස්ථාවට සහභාගී වූ බවත් ඒ අනුව ධර්මාශෝක විද්‍යාලයට මීටර් 509ක්ද දේවානන්ද විද්‍යාලයට මීටර් 579ක්ද ලෙස දුර පැවැති බවත් සඳහන් කර ඇත. ඒ අනුව ලකුණු නිවැරදි බවට තීරණය කර අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කල බවත් මීට විරුද්ධ වූ ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්ද ඇතුළු තිදෙනෙක් නැවත දුර මැනීම සඳහා අදාළ උපකරණ රැගෙන පැමිණි නිසා අභියාචනා සහ විරෝධතා මණ්ලයේ සාමාජිකයන් හතර දෙනෙකුද පෙර පැමිණි තිදෙනාද සමගින්, හත්දෙනෙකුගෙන් යුතු පිරිසක් මෙම දුර මැනීමට ගිය බවත් GPS උපකරණයේ ලිඛිත තොරතුරු දෙමාපිය නියෝජිත, ඩී. සමන් දර්ශනද සිල්වා මහතා සටහන් කර ගත් බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව පැමිණිලිකරුගේ නිවසේ සිට ධර්මාශෝක විදුහලටත්, දේවානන්ද විදුහලටත් දුර මැන බැලූ බවත්, ධර්මාශෝක විදුහලට නාවුක සැතපුම් 0.29ක්ද දේවානන්ද විදුහලට නාවුක සැතපුම් 0.22 ක්ද, වූ නිසා ලකුණු 05ක් අඩු කල බවත් ප්‍රකාශ කර ඇත. නැවත විදුහලට පැමිණි විරෝධතාකරු වන ඩබ්.පී. රුවන්ති ලක්මාලි මියගේ ගොනුව පරීක්ෂා කිරීමේදී එහි නිවසේ සිට පාසලට ඇති දුර දක්වන සිතියම බලයලත් මිනින්දෝරු එල්.පී. නිහාල් එම් ද සිල්වා විසින් මැන ධර්මාශෝක විදුහලට දුර මීටර් 310ක් ලෙස කියා තිබූ නිසා නැවත වරක් විරෝධතාකරුගේ නිවසට දුර මැනීමකින් තොරව විරෝධතාකරු පාසලට වඩා ආසන්න බව තීරණය කල බවද සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

මෙම පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව ලකුණු 70ක් උපයාගෙන ඇති අතර, ඉදිරිපත්ව ඇති විරෝධතාවයත් සඳහාද විදුහල මගින් පෙත්සම්කරු කැඳවා ඇතත් එහිදීද ලකුණු 70ක් වෙනසකට ලක්ව නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම අභියාචනා සහා විරෝධතා පරීක්ෂණයේදී Google සිතියම මගින් දුර පරීක්ෂා කර ධර්මාශෝක විදුහලට, දුර මීටර් 509ක්ද දේවානන්ද විද්‍යාලයට දුර මීටර් 579ක්ද ලෙස දුර නැවත මැනුම් කර පෙත්සම්කාරියගේ ලකුණු 70 ස්ථිරත්වයට පත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

නමුත් අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සාමාජික ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්වරයාගේ ඉහත මැනුමට අභියාචනා පරීක්ෂණයට පසුව විරුද්ධ වී ඇති හෙයින් පෙත්සම්කාරිය හා විරෝධතාකරු යන සියළු දෙනා මෙම නීත්‍යානුකූල පරීක්ෂණය සිදු කර පිටව ගිය පසු නැවත මැනුමක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව නිරීක්ෂණය වේ.

එම මැනුම සඳහා විද්‍යාලයීය පරිපාලන කටයුතු සඳහා යොදවා ගත නොහැකි ධීවරයන් දෙදෙනෙකු යොදවා ගනිමින් GPS තාක්ෂණය භාවිතා කර ඇති අතර එම පරීක්ෂණය සඳහා පෙත්සම්කාරිය සහභාගි කර ගෙන නොමැති අතර ඒ වන විට පොරොත්තු ලේඛනයෙහි සිටි ඩබ්.පී රුවන්ති ලක්මාලි මියගේ සහාය සඳහා මෙකී සියළු පාර්ශවයන් පොදු චේතනාවෙන් යුතුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

පාසල් වල පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 23/2013 චක්‍ර ලේඛනයේ 10.6 වගන්තියෙන් දක්වන්නේ, “විරෝධතා විභාග කිරීමේදී, විරෝධතා වලට ලක් වූ ළමයාගේ මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන පමණක් (ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ) නැවත වරක් විමර්ශනය කරන අතර විරෝධතාව දැක්වූ අය කැඳවා විරෝධතාවෙහි නිරවද්‍යතාවය විමර්ශනයට ලක් කළ යුතුය. ඉන්පසු විරෝධතාවයට ලක් වූ ළමයාගේ මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් කැඳවා පරීක්ෂා කර තීරණයකට එළඹීම අවශ්‍ය වේ” යනුවෙනි.

තවද චක්‍ර ලේඛනයේ 10.8 වගන්තියෙන් දක්වන්නේ “අභියාචනා හා විරෝධතා විභාග කිරීමේ කටයුතු විවෘතව හා විනිවිද භාවයෙන් යුක්තව පැවැත්විය යුතු අතර කමිටුවට යම් කරුණක් පිළිබඳව සනාථ

කර ගැනීමට (ස්ථානීය පරීක්ෂණය ඇතුළු) අවශ්‍ය අවස්ථාවල ඊට අදාළ විවිධ පියවර ගත හැකිය" වශයෙනි.

චක්‍රලේඛනයෙහි මෙම වගන්තිවලට අනුකූලව අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් මුල් අවස්ථාවෙහි කටයුතු කර පෙත්සම්කාරිය වෙත සිය තීරණය දැනුම්දී තිබියදී, එකී මණ්ඩලයෙහි ආදි ශිෂ්‍ය සංගම් නියෝජිතවරයාට අවශ්‍ය පරිදි තැවත වරක් මෙම චක්‍රලේඛන පිළිබඳ අවබෝධයක් නොමැති තෙවන පාර්ශවයක් වන ධීවරයන් දෙදෙනෙකු යොදවා ගෙන මෙම පාසල් අතර දුර මිනුම් කිරීම නීති විරෝධී කටයුත්තක් බව නිරීක්ෂණය වේ. එසේම එම කටයුත්ත මෙම චක්‍රලේඛනයෙහි 10.8 හි දක්වන පරිදි විනිවිදභාවයෙන් පවත්වා නොමැති බවද නිරීක්ෂණය වේ.

විරෝධතාකරු වෙතින් ලද විරෝධතාවයට නීත්‍යානුකූල ලෙස පාර්ශවයන් කැඳවා 10.6 වගන්තිය පරිදි ක්‍රියාකර පසුව යම් පෙලඹවීමක් මත 10.8 වගන්තිය උල්ලංඝනය වන පරිදි කටයුතු කිරීමට සභාපති ඇතුළු අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර ඇත. මෙසේ නීති විරෝධී ලෙස කටයුතු කිරීම තුළින් පෙත්සම්කාරිය වෙත අගතියක් සිදුව ඇති අතර වගඋත්තරකරුවන්ගේ මෙම ක්‍රමවේදය පෙත්සම්කාරිය විෂයෙහි පමණක් භාවිතා කළ බවද වගඋත්තරකරුවන් විසින් පරීක්ෂණයේදී පිළිගෙන ඇත.

තවද කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා සහ අභියාචනා සහ විරෝධතා පරීක්ෂණය සඳහා විදුහල මගින් භාවිතා කරන ලද සිතියම පරීක්ෂා කරන ලද අතර එහිදී පෙත්සම්කාරිය සඳහා වඩාත් ආසන්න පාසල ධර්මාශෝක විද්‍යාලය බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් විනිවිදභාවයෙන් තොරව පවත්වන ලද ස්ථානීය පරීක්ෂණයේ ප්‍රතිඵල නෛතිකව පිළිගත නොහැකි ප්‍රතිඵලයක් බවට පත් වනු ඇත. මන්ද යත් එකී GPS තාක්ෂණයෙන් සිදුකර ඇති දුර මැනීම සම්බන්ධව විදුහලට සම්බන්ධයක් නොමැති, නෛතිකව පිළිගත නොහැකි, තෙවන පාර්ශවයක් සම්බන්ධ කර ගැනීම සහ ඊට පැමිණිලි පාර්ශවය දායක කර නොගැනීම සහ චක්‍රලේඛනය ප්‍රකාරව අභියාචනා සහ විරෝධතා පරීක්ෂණය නීත්‍යානුකූල පවත්වා එහි ප්‍රතිඵලය පෙත්සම්කාරිය වෙත දැනුම්දී තිබීම යන කරුණු හේතුවෙනි.

**නිගමනය :-**

අදාළ වගඋත්තර පාර්ශවය විසින් චක්‍රලේඛනයෙහි 10.6, 10.8 වගන්තීන් උල්ලංඝනය වන අයුරින් කටයුතු කිරීම තුළින් පෙත්සම්කාරිය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව III වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර දී ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමේ නීතියේ

රුකවරණය සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිය උල්ලංඝනය වන අයුරින් 03 වන වගඋත්තරකාර පාර්ශවය ක්‍රියාකර ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පෙත්සම්කාරියගේ දරුවා වන සෙල්ලානන්දි ශෙනුලි අමායාද සිල්වා දැරිය අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ 2016 පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වන අතර, 2016 පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේදී යම් හෙයකින් ගැටළුවක් උද්ගත වන්නේ නම් 2017 වර්ෂයේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.07.11 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02 ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී,
මානව හිමිකම් කොමිෂන් සභාව, මාතර.

B/